**නානාටාන් ප්‍රාදේශීය සභාව**

**මන්නාරම දිස්ත්‍රික්කය**

--------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශ**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුව තිබුණි. කෙසේ වුවද ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2011 අප්‍රේල් 26 දිනදී වන අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2010 ජූනි 22 දිනදීය.

1.2 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනියන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව නානාටාන් ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට නානාටාන් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

1.3 **මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

----------------------------

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි අනාවරණය කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) උතුරු නැගෙනහිර පළාත් සභාවේ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා දරන ලද රු.53,309 ක් වූ වියදම්, සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම් ලෙස සලකා තිබුණු අතර ඒ හේතු කොටගෙන වියදම ඒ හා සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයන්ට අදාළ එකතුව රු. 76,036 ක් වූ වියදම්, විවිධ ණයහිමියන්ගේ ගිණුම්වලට (උපචිත වියදම්) ගලපනු වෙනුවට සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂය සඳහාවූ වියදම් ඒ හා සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.**

---------------------------------------------

**විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොවීම**

----------------------------------------------------

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු නොමැති වීම හෙතුවෙන් වටිනාකම රු.498,565 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.4 අනුකූල නොවීම්**

-------------------

පහත සඳයන් නීති, රීති හා රෙගුලාසි සහ කළමණාකරණ තීරණයන්හි විධිවිධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (අ) වගන්තිය | - | රු.1000 ඉක්මවා ආගමික සහ පොදු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වූවද, එසේ අනුමැතිය නොලබා ආහාර පාන සඳහා රු.53,309 ක් ගෙවා තිබුණි. |
| **(ආ)** | **ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති-1988** | | |
| | V වැනි පරිච්ඡේදයේ 140 වැනි වගන්තිය | - | රු.250,425 ක්වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | **රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 437** | - | මෙම චක්‍රලේඛයට පටහැනිව වාහන දෙකක් රු.1,200 කට පෞද්ගලික රක්ෂණ සමාගමක රක්ෂණය කර තිබුණි. |

(ඇ) රජයේ ආයතන සංග්‍රහය

(i) VII වැනි පරිච්ඡේදයේ 12.3 වගන්තිය - මෙම වගන්තියට පටහැනිව ලේකම්වරයාට වැඩබැලීමේ වැටුප් ගෙවා තිබුණි.

(ii) VIII වැනි පරිච්ඡේදයේ 10 වැනි වගන්තිය - මෙම වගන්තියට පටහැනිව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් තිදෙනෙකුට නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. එහි ප්‍රතිපලයක් වශයෙන් රු.78,701 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව, 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.3,641,353 ක් ව අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ ප්‍රනරාවර්ථන වියදම රු.1,192,776 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු, ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ ආකාරයට පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 200 | 38 | - | 30 | 118 | - |
| කල්බදු කුලී | 1,507 | 1,246 | - | 757 | 691 | - |
| බලපත්‍ර ගාස්තු | 346 | 241 | - | 1,115 | 1,186 | - |
| වෙනත් ආදායම් | 1,313 | 16,194 | 431 | 1,156 | 766 | - |

### 2.2.2 මුද්දර ගාස්තු

සභාව වෙත ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා අයවැයගත සහ තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 8,991 | 7,332 | 1,759 | 8,218 | 7,006 | 1,212 |
| වෙනත් වියදම් | 1,830 | 1,992 | (162) | 1,427 | 2,269 | (840) |
| උප එකතුව | 10,821 | 9,224 | 1,597 | 9,645 | 9,275 | 372 |
| ප්‍රාග්ධන වියදම් | 1,005 | 5,254 | (4,249) | 615 | 4,760 | (4,145) |
| මුළු එකතුව | 11,826 | 14,478 | (2,652) | 10,260 | 14,035 | (3,773) |

### 2.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික මට්ටම | 02 | 01 |
| ද්විතීය මට්ටම | 12 | 08 |
| ප්‍රාථමික මට්ටම | 19 | 17 |
| වෙනත් (අනියම්/තාවකාලික) | - | 03 |
| එකතුව | 33 | 29 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.2,416,095 ක් වූ අතර වර්ෂයකට අධික කාලයකට අයත් වූ ශේෂයන්ගේ එකතුව රු.1,917,215 ක් විය.

### 2.5.2 අයවිය යුතු සේවක ණය

2010 දෙසැම්බර 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය එකතුව රු.2,242,110 ක් වූ අතර වර්ෂ 01 කට අධික කාලයක් හිඟහිට පැවත් ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.18,502 ක් විය.

### 2.5.3 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂයකට අධික කාලයක් අචල ජංගම වත්කම්වල වටිනාකම රු.1,976.965 ක් විය.

### 2.5.4 සමීක්ෂණය නොකළ වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට භෞතික සත්‍යොක්ෂණ/ සමීකෂණ මණ්ඩල වාර්තා මගින් සනාථ නොකළ පොත් ශේෂයන් මත ගණනය කළ වත්කම්වල වටිනාකම රු.51,928,357 ක් විය.

### 2.5.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් ආවරණය නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රදර්ශණයක් සඳහා තල් නිෂ්පාදන මිලදී ගැනීම සඳහා සභා අරමුදලින් රු.45,450 ක් වැයකර තිබුණි.

(ආ) උතුරු පළාත් සභාවේ සංචාරක කටයුතු සංවර්ධන වැඩසටහන යටතේ ඉඩම් පර්යේෂණ වාර්තාවක් පිළියෙල කිරීම සඳහා රු.66,743 ක මුදලක් වැයකර තිබුණි.

(ඇ) අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා සභා අරමුදලින් රු.70,808 ක් වැය කර තිබුණි.

(ඈ) 05 ශ්‍රේනියේ ශිෂ්‍යත්ව විභාගය සමත්වූ ශිෂ්‍යයින්ට රු.16,000 ක මුදලක් පරිත්‍යාග වශයෙන් ලබාදී තිබුණි.

2.6 **කාර්යසාධනය**

-----------------

සභාව ගිණුම් වර්ෂය ආරම්භයේදී වාර්ෂික ක්‍රියාකර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එම නිසා, ඉටු කිරීම අපේක්ෂිත අරමුණු සහ එහි ප්‍රගතිය සොයා දැනගැනීමට නොහැකි විය.

2.7 **අභ්‍යන්තර විගණනය**

------------------------

ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. **පද්ධති සහ පාලන**

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වාහන උපයෝජනය
(ඉ) වත්කම් කළමනාකරණය